Nava 52(1) - 62



උද්භිද විද්‍යාව

# කඳුළු වගුරන ගස



හල්තොට සමූහ – විනීතා මානෙල් ගමගේ

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝග අතර ප්‍රමුඛස්ථානයක් රබර්වලට හිමි වුයේ පසුගිය වකවානුව තුළ දී වුවද වර්තමාන තත්ත්වය ඊට හාත්පසින් ම වෙනස් ය. රබර් ගසේ නිජබිම වන්නේ බ්‍රසීලයේ ඇමේසන් ගංගාධරය යි. එහි විසූ ස්වදේශිකයෝ "කව් චු කූ" නමින් මෙම ගස හඳුන්වා ඇත්තේ "කඳුළු වගුරුවන ගස" නම් අරුත ප්‍රකාශ කිරීමටය. මෙය පාරා රබර් යනුවෙන් ද සැලකේ.

රබර් ගසේ පීතෘවරයා ලෙස ගෞරව නාමයෙන් පිදුම් ලබන්නේ එච්.ඒ.වික්හම් (පසුව සර් හෙන්රි) මහතා ය. පෙරදිග රටවලට රබර් ගස හඳුන්වා දුන්නේ ඔහුය. 1876 දි වික්හම් දකුණු ඇමරිකාවේ බ්‍රසීලය බලා යාත්‍රා කළේ එවකට එංගලන්තයේ නිව් නැමති රාජකීය උද්‍යානයේ අධිරාජ්‍යයා වු සර් ජේම්ස් හුකර්ගේ මෙහෙයවීම මතය. "තාපාගෝස්" හා 'මදීරා' යන ගංගාධාර අසබඩ කැලෑවෙන් සොයා ගත් රබර් ඇට 70,000 ක් වික්හම් විසින් (සර් හෙන්රි) එංගලන්තයට රැගෙන එනු ලැබීමෙන් පසු කිව් උද්‍යානයේ පැළ කළේ ය. මෙම රබර් ඇටවලින් පැළ වූයේ 7000 ක් වුවත් ඉන් පැළ 1919 ක් ලංකාවට රැගෙන ආවේ 1876 දීය.

ලංකාවට ආගන්තුක වූ මෙම රබර් පැළ "හිවියා බ්‍රසීලියන්සිස්" නම් වූ අතර හෙනරත්ගොඩ හා පේරාදෙණි උද්භිද උද්‍යානවල පැළ කිරීම සිදු වූයේ ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ය. පෙරදිග රටවල් වන මලයාව, සිංගප්පූරුව හා ඉන්දුනීසියාව යන රටවලට රබර් වගාව හඳුන්වා දීමට මෙම පැළ ඉවහල් විය.

හෙනරත්ගොඩ පැළ කළ රබර් පැළ වලින් ඉන් වසර 05 කට පසුව මල් හටගෙන ගෙඩි හටගත් බැවින් ඒවායින් ලබා ගත් රබර් ඇට 36 ක් මඟින් ප්‍රථම වරට පැළ තවාන් කිරීම ආරම්භ කරන ලදී. එමෙන්ම අත්හදා බැලීමේ වගා පිහිටුවීම සඳහා වැවිලිකරුවන් අතර ද පැළ බෙදා හරින ලදී. මේ ආකාරයට වරින් වර සුමාත්‍රා, ජැමෙයිකා, බෙරනියෝ හා පෙරදිග අප්‍රිකානු රටවලට ද රබර් පැළ යැවුණු අතර 1906 දී රබර් ගසේ නිජබිම වූ බ්‍රසීලයට ද ලංකාවෙන් රබර් පැළ නැව්ගත කිරීම රබර් ඉතිහාසයේ විස්මයජනක සිදුවීමක් සනිටුහන් කිරීමකි.

වර්තමානයේ ඉතා පහත් තත්ත්වයකට රබර් කර්මාන්තය ඇද වැටී තිබුණ ද ශතවර්ෂයකටත් අධික කාලයක් ශ්‍රී ලංකාව සශ්‍රික කළේ රබර් කර්මාන්තය මඟිනි. අද රබර් වගාකරන බිම් ප්‍රමාණය සාමාන්‍යයෙන් හේකටයාර් 124,000 ක් පමණ වුවද මුල් යුගයේ දී හෙක්ටයාර දෙලක්ෂයකට අධික බිම් ප්‍රමාණයක රබර් වගාව අපරාජිතව වැජඹුණු බව කිව යුතුය. ක්‍රමයෙන් රබර් වගාව පහත වැටීමකට හේතු වු බවට සාධකයක් වන්නේ වර්ෂයකට නිෂ්පාදිත රබර් ප්‍රමාණය වර්තමානයේ මෙට්‍රික් ටොන් 96,000 ක් වීමත් 1978 වසරේ දී මෙට්‍රික් ටොන් 155000 ක ඉහළ අගයක් ගැනිමත් ය.

වියළි රබර් අමු ද්‍රව්‍යයක් ලෙසට භාවිත කළ ද රබර් ශාකයෙන් ලැබෙන ප්‍රයෝජනය එපමණක් නොවේ. සිංහරාජ වැනි වැසි වනාන්තරවලින් කෙරෙන මෙහෙවරට වඩා වැඩි සේවයක් කෙරෙන රබර් වගාව නිසා අකුණු වළක්වා ගැනීමේ හැකියාව වැඩි බව ද අනාවරණය වී තිබේ.

මෙරට ප්‍රධාන අපනයන බෝගය වන තේ වියළීම සඳහා භාවිතා කරන්නේ රබර් දැවය. එමෙන්ම මුළු තැන්ගෙයි වැඩ කටයුතු මෙන්ම පාන්, හුණු, ගඩොල් හා උළු පෝරණු සඳහාත් භාවිත කරන්නේ රබර් දැව වීම විශේෂත්වයකි.

මුල් අවුරුදු 20 තුළ රබර් වගාව ව්‍යාප්ත වූයේ ඉතා සෙමිනි. ඒ අත්හදා බැලීමේ වගාවක් ලෙසිනි. වෙළෙඳ වගාවක් ලෙසට රබර් වගාව ආරම්භ කරන ලද්දේ ප්‍රථමයෙන්ම හොරණ ප්‍රදේශයේ බවට වාර්තා වේ. රබර් සඳහා ඉල්ලුම ඉහළ යෑමට පටන් ගැණුනේ 1900 දී පමණ ය. එයට හේතු වූයේ මෙම කාලයේ මෝටර් රථය නිපැදවීම ය. 1942 දී තෝමස් හැනොක් සහ චාල්ස් ගුඩ් ඉයර් යන දෙදෙනා විසින් රබර් වල්කනයිස් කිරීම සොයා ගැනීමක් රබර්වලට වැඩි ඉල්ලුමක් ඇති වීමට තවත් හේතුවක් වී තිබිණි. ක්‍රමයෙන් රබර් වගාවේ ව්‍යාප්තියත් සමඟ විවිධ ක්‍රම භාවිත කරමින් රබර් ගසෙන් කිරි ලබා ගැනීමට වැවිලිකරුවෝ පුරුදු වූහ. කැති පොරෝ ආදියෙන් පොත්ත රැහීම හෝ උල්වලින් ඇනීම ආදී අක්‍රමවත් ක්‍රම රාශියක් ඔවුහු භාවිත කළහ. ඉන් පසු කාලයේ දී මාළුවකු ගේ කොඳු නාරටිය බඳු (හෙරින්-බෝන්) සහ අර්ධ හෙරින් බෝන් සර්පිලාකාර හා "වී" කැපුම (V)ආදී ක්‍රමවලටත් කරන ලද කිරි කැපීම වර්තමාන තත්ත්වය දක්වා දියුණු වී තිබේ.

කිරි කැපීම පිළිබඳ ප්‍රථම අත්හදා බැලීම සිදු කරන ලද්දේ ලංකාවේ යටිපෝරුවේ දී ය. මුල්ම සාර්ථක කිරි කැපීමේ ක්‍රමය ලොවට හඳුන්වා දීමේ ගෞරවය හිමි වෙන්නේ සිංගප්පූරු උද්භිද උද්‍යානයේ අධිපති සර් හෙන්රි රිඩ්ලි මහතාට ය. එමෙන්ම අප දැනට භාවිත කරන කිරි කැපුම් ක්‍රම වැඩි දියුණු කරන ලද්දේ ලංකා රබර් පර්යේෂණායතනයේ අධ්‍යෂව සිටි (නැසීගිය) සි.පී.ද සිල්වා මහතා ය. අඩ කවාකාරව දිනක් හැර දිනක් කිරි කැපීම සිදු කිරීම අද වඩාත් ප්‍රචලිත ක්‍රමයයි. මෙම ක්‍රමයෙන් පොත්ත යළි ලියැලීම සිදුවන අතර ගසට ද කිසිදු හානිකර තත්ත්වයක් ඇති නොවේ. මේ අනුව ගසකින් කිරි ලබා ගත හැකි කාලය වසර 30 ක් පමණ වන බව ද කිවයුතුය.

රබර් ගස සිටුවා කිරි කැපීම දක්වා ගත වන දීර්ඝ කාලය හේතුවෙන් සුළු රබර් වගාකරුවන් මන්දෝත්සාහි තත්ත්වයට පත් වී සිටිති. රබර් මිලෙහි වර්ධනය දුර්වල තත්ත්වයක පැවතීමත් ආධාර මුදල් මෙන්ම උපදේශක සේවාවන් ප්‍රමාණවත් නොවීමත් මෙයට බලපාන තවත් හේතුන් වේ. මේ නිසා රබර් වගාකරුවන් දිරිමත් කිරීමේ විවිධ වැඩසටහන් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

බර් පර්යේෂණායතනය මඟින් අලුත් නිෂ්පාදන, සොයා ගැනීම නිසා ඉක්මනින් වැඩෙන, ලෙඩ රෝග නොවැළඳෙන, වැඩියෙන් කිරි ලබා ගත හැකි දැවමය වටිනාකම වැඩි ක්ලෝන හඳුන්වාදෙන ලදී. RRIC – 100, 121, 204, 205 ආදී වශයෙන් වූ මේ නව ක්ලෝන වලින් රබර් වගාවේ දියුණු තත්ත්වයක් ඇති වී තිබේ. හෙක්ටයාරයකට කි. 3500 ක් ලබාගත හැකි නව ක්ලෝන හඳුන්වා දී ඇත.

දැනට කෑගල්ල දිස්ත්‍රික්කයේ රබර් වගාව බහුල වශයෙන් කෙරෙන අතර කළුතර දෙවැනි ස්ථානය ගෙන තිබේ. එහෙත් මොණරාගල ප්‍රදේශයේ අක්.50,000 ක රබර් වගා කිරීම ආරම්භ කර ගෙන යන බැවින් අනාගතයේ දී මුල් ස්ථානය මොණරාගලට හිමිවිය හැකි බවට අනුමාන කෙරේ. වාතයට ලබා දීමේ ක්‍රියාවලියේ ඉදිරියෙන්ම සිටින රබර් ශාකය අකුණු ගැසීමේ ප්‍රවණතාවය අඩු කිරීමේ හැකියාවක් ද දක්වයි.

රබර් ගස නැවත ලංකාවේ ව්‍යාප්ත කිරීමට ගන්නා උත්සාහයක් ලෙස ප්‍රාදේශීය කුඩා රබර් වගාකරුවන් නඟා සිටුවීම සඳාහා රබර් ඇටයේ පටන් වගාව සඳහා බිම සකස් කිරීම, පස සංරක්ෂණය කිරීම, පොහොර භාවිතය හා වල් නෙළීම, කිරි කැපීම, වැළඳෙන රෝග හඳුනා ගැනීම සඳහා ප්‍රතිකාර භාවිතය, හොඳ තත්ත්වයේ රබර් ෂීට් නිෂ්පාදනය කිරීම, කිරි අලෙවියේ දී ගැණුම්කරුවා විසින් ගොවියා රවටන ආකාරය ආදී සියලුම කරුණු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දැනට ප්‍රාදේශීය රබර් ව්‍යාප්ති නිලධාරීන් විසින් පැවැත්වීමට කටයුතු කරනු ලැබ තිබීම නිසා රබර් වගාකරුවන්ගේ උනන්දුව හා ඒ කෙරෙහි නැඹුරුවීම වැඩි වී තිබේ. ❐

කිරි කැපීම පිළිබඳ ප්‍රථම අත්හදා බැලීම සිදු කරන ලද්දේ ලංකාවේ යටිපෝරුවේ දී ය. මුල්ම සාර්ථක කිරි කැපීමේ ක්‍රමය ලොවට හඳුන්වා දීමේ ගෞරවය හිමි වෙන්නේ සිංගප්පූරු උද්භිද උද්‍යානයේ අධිපති සර් හෙන්රි රිඩ්ලි මහතාට ය. එමෙන්ම අප දැනට භාවිත කරන කිරි කැපුම් ක්‍රම වැඩි දියුණු කරන ලද්දේ ලංකා රබර් පර්යේෂණායතනයේ අධ්‍යෂව සිටි (නැසීගිය) සි.පී.ද සිල්වා මහතා ය. අඩ කවාකාරව දිනක් හැර දිනක් කිරි කැපීම සිදු කිරීම අද වඩාත් ප්‍රචලිත ක්‍රමයයි.

